**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2022 - 10 - 18 |

පැමිණිලි පාර්ශවය : දූලිකා ප්‍රියදර්ශනී කෝදාගොඩ,
අංක 317/73,
සමාධි මාවත,
මහකන්ද,හිඳගල.

වගඋත්තර පාර්ශවය : 01 ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. ආර්.ඩී.ජමින්ද මයා, (ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්),
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

03. එච්.හේවගේ මයා,
අතිරේක ලේකම් (පාලන),
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

<u>පැමිණිලි අංකය : **HRC/K/396/19/A**</u>

**පැමිණිලි පාර්ශවයේ සැළකිරීම :-**

මහනුවර කිංස්වුඩ් විද්‍යාලයට අනුයුක්තව රාජ්‍ය කළමණාකාර සහකාර II තනතුරේ සේවය කරන දූලිකා ප්‍රියදර්ශනී කෝදාගොඩ යන අය විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2019.08.05 දින තමා පාසල් කාර්යාලයේ සිටින විට විදුහල්පතිවරයා විසින් ෆැක්ස් පණිවුඩයක් මාර්ගයෙන් ගෙන්වා ගන්නා ලද අධ්‍යාපන අමාත්‍යංශයේ අතිරේක ලේකම්වරයාගේ




ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office — 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. — සභාපති / தவிசாளர் 011-2505451 — ෆැක්ස් / தொலைநகல் 011-2505541/ 74 — ඊමේල් / மின்னஞ்சல் sechrcsl@gmail.com

අංක ඊඩී/05/6715/111 හා 2019.07.31 දිනැති ස්ථානමාරු ලිපියක් තමාට ලබා දුන් බවත්, තමා ස්ථාන මාරුවක් ඉල්ලා නොමැති අතර, තමා ඒකාබද්ධ සේවයට අයත් බවත් තමාගේ ස්ථාන මාරුවීම් රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් සිදුකළ යුතු නමුත් ස්ථාන මාරුවීම් ලිපියේ කිසිදු පිටපතකින් ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත දැනුවත් කිරීමක් සිදු කර නොමැති බවත්ය. තමා විශේෂ පුහුණුවක් ලද විශේෂ සේවකයෙක්ද නොවන බැවින්මෙම ස්ථානමාරුවට හේතු විමසීම සඳහා එදින පෙරවරුවේ තමා විදුහල්පතිතුමාගේ කාර්යයාලයට ගිය අතර, එහිදී කරුණු විමසීමේදී විදුහල්පතිතුමා තමාට සුපුරුදු පරිදි පරුෂ වචනයෙන් බැණ වැදී කෝපයෙන් තමාගේ කොණ්ඩයෙන් ඇදගෙන ගොස් කාර්යයාලයෙන් ඉවතට තල්ලු කොට දොර වසා පිටව ගිය බවත්, තමා අධික වේදනාවටත්, ලැජ්ජාවටත්, බියටත් පත්වී පාසල තුළ සැඟවී සිට රාජකාරී වේලාව අවසන් වූ පසුව මහනුවර පොලිස් ස්ථානයේ පැමිණිලි කළ බවත්, එහිදී තමා පත්වී තිබූ ශාරීරික හා මානසික පීඩනය හේතුවෙන් මහනුවර මහ රෝහලට ඇතුළත් කළ බවත්, 2019.08.09 දින ප්‍රතිකාර ලබා නිවසට පැමිණි අතර, නැවත සති දෙකකින් තමාට රෝහලට පැමිණෙන ලෙස වෛද්‍ය උපදෙස් ලැබුණු බවත් සඳහන් කර ඇත.

දැනට වසරක පමණ පෙර සිට තමාට විදුහල්පතිවරයා ද්වේශ සහගතව පෞද්ගලික පළිගැනීම් කරන බැවින් ඒවා වළක්වා දෙන ලෙස කලාප අධ්‍යාපන ආයතනය දැනුවත් කළද කිසිදු සහනයක් නොමැති බවත්, තමා රාජකාරී කටයුතු පැහැරහැර හෝ කිසිදු අණ පනත්වලට පටහැනිව ක්‍රියා කර නොමැති බවත්, කිසිදු මූලික විමර්ශනයක් තමා සම්බන්ධයෙන් සිදු කර නොමැති බවත්, මෙම ස්ථාන මාරුවීම මෙම විදුහල්පතිවරයා විසින් ඔහුගේ අවශ්‍යතාවය මත ඔහුට හිතවත් අමාත්‍යාංශ නිලධාරියෙකු විසින් සකස් කර තමාගෙන් පෞද්ගලිකව පළිගැනීමට සිදු කරන ලද එකක් බවත් දක්වා ඇත. මෙම අයුක්ති සහගත ස්ථාන මාරුවීම අවලංගු කර දෙන ලෙසත්,තමාට වර්තමාන සේවා ස්ථානයේ සේවය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් පැමිණිල්ලෙන් ඉල්ලා ඇත.

**වගඋත්තර පාර්ශවයේ සැළකිරීම :-**

වගඋත්තර පාර්ශවය ලෙස අධ්‍යාපන අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් ආර්.ඩී.ජමින්ද මහතා කරුණු දක්වමින් පවසා ඇත්තේ, මහ/කිංස්වුඩ් විද්‍යාලයේ සේවයේ නියුතු කළමණාකාර සහකාර II පන්තියේ නිලධාරිනී ඩී.පී.කෝදාගොඩ මියගේ අසතුටුදායක සේවා තත්වය සම්බන්ධයෙන් එම විදුහලේ විදුහල්පති වෙතින් ලද පැමිණිල්ලකට අනුව ඉහත නම් සඳහන් නිලධාරිනිය අධ්‍යාපන අමාත්‍යාංශ වෙත ස්ථාන මාරු කරන ලද බවත්, එම ස්ථාන මාරුවීමට එරෙහිව නිලධාරිනිය විසින්ද විදුහල්පතිවරයාට එරෙහිව කරුණු ඉදිරිපත් කරන ලද අතර, ඒ අනුව අදාළ කරුණු පිළිබඳව සොයා බැලීම සඳහා මෙම අමාත්‍යාංශයේ විමර්ශන අංශය විසින් මූලික විමර්ශනයක් සිදු කිරීම සඳහා කටයුතු කර ඇති බවත් එහි

අතුරු වාර්තාව අනුව, මූලික විමර්ශන කටයුතු අවසන් වන තෙක් වහාම ක්‍රියාත්මක වන පරිදි උක්ත නිලධාරිනිය මහනුවර කලාප අධ්‍යාපන කාර්යයාලය වෙත අනුයුක්ත කර ඇති බවත් දක්වා ඇත.

වගඋත්තර පාර්ශවය ලෙස කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් කරුණු දක්වමින් පවසා ඇත්තේ, ඉහත පැමිණිලිකාරිය හට අමාත්‍යාංශයේ ලේකම්ගේ අත්සනින් යුතුව වහාම ක්‍රියාත්මක වන පරිදි ස්ථාන මාරුවක් ෆැක්ස් මඟින් තමා වෙත ලැබුණු බවත්, 2019/08/05 දින ඇයට එම ලිපිය භාර දුන් බවත්ය. එම ලිපිය ලද පසු ඇය දෙවරක් කාර්යාලයට පැමිණ කුමන හේතුවක් නිසා තමා විසින් ඇයව ස්ථාන මාරුකර යවන්නේද සහ ඇයට පැවරෙන රාජකාරී මොනවාද යන්නත් විමසූ බවත්, ඊට තමා පිළිතුරු ලබා දුන් බවත් එහිදී ඇයට පරුෂ වචනයෙන් බැණ වැදීමක් හෝ ඇගේ කොණ්ඩයෙන් ඇදගෙන ගොස් කාර්යාලයෙන් පිටතට තල්ලු කිරීමක් නොකළ බවත් සඳහන් කර ඇත. ඇය විසින් මේ සම්බන්ධයෙන් මහනුවර පොලීසියට කළ පැමිණිල්ලට අනුව 2019/08/08 දින විද්‍යාලයට පොලිස් නිලධාරීන් පැමිණ කරුණු විමසූ බවත්, 2016.08.05 දින දුලීකා කෝදාගොඩ මිය තම කාර්යාලයට පැමිණි අවස්ථා දෙකේදීම ප්‍රාථමික ප්‍රධාන ටී.කේ.අමුණුගම මිය එහි රාජකාරී කටයුත්තක නිරත වී සිටි බවත්, මෙබඳු දෙයක් සිදු වූවානම් ඇයද මෙම සිදුවීම අසා දැක තිබිය යුතු අතර ඇයගේ සාක්ෂියෙන් ද එබඳු දෙයක් හෙළි නොවූ බවත්, එසේම තමා හමුවීමට පැමිණි ගුරු මහත්මීන් 4 දෙනෙකු ද එම අවස්ථාවේ කාර්යාලයේ සිටි බවත් දක්වා ඇත.

තවද මෙම පැමිණිලිකාරියගේ සේවය අකාර්යක්ෂම බව තමා විසින් කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත දන්වා ඇති අතර, පාසලේ සහ කාර්යාලයේ කටයුතු ක්‍රමවත්ව, විධිමත්ව හා නීත්‍යානුකූලව පවත්වාගෙන යාම හැර පාසලේ කාර්ය මණ්ඩලයේ මෙවැනි අයවලුන් සමඟ තමාගේ පෞද්ගලික අමනාපයක් නොමැති බවත්, ඒ අනුව විද්‍යාලයේ කටයුතු සංවිධානය කිරීම හා අධීක්ෂණය කිරීම තමාගේ කාර්යයක් සහ වගකීමක් බවත්, පැමිණිලිකාරිය විසින් මහනුවර පොලීසියට කළ පැමිණිල්ල අනුව තමාගේ සාක්ෂි විමසීම 2019/08/24 දින මහනුවර පොලීසියේ සිදුවූ බවත් ඇය විසින් මෙම අසත්‍ය චෝදනා ඇතුළත් පැමිණිල්ල කර ඇත්තේ තමා කෙරෙහි ඇති ද්වේශයෙන් සහ අපහාස කිරීමේ අරමුණින් බවත් වැඩිදුරටත් දක්වා ඇත.

**පරීක්ෂණ හා විමර්ශන කටයුතුවලින් අනාවරණය වී ඇති කරුණු :-**

අපැමිණිලිකාරිය ඒකාබද්ධ සේවයට අයත් රාජ්‍ය කළමණාකාර සහකාර ලෙස සේවය කරන අතර වාර්ෂික ස්ථාන මාරු යටතේ 2016/01/04 දින සිට මහනුවර කිංස්වුඩ් විද්‍යාලයේ සේවය කර ඇත.

පැමිණිලිකාරියට 2019/08/05 දින ලැබී ඇති හදිසි ස්ථාන මාරු ලිපිය පිළිබඳව විදුහල්පතිවරයාගේ කාර්යාලයට ගොස් විමසීමේදී විදුහල්පතිවරයා විසින් පහරදී කොණ්ඩයෙන් ඇදගෙන ගොස්

කාර්යාලයෙන් එළියට දමා දොර වැසූ බවට පැමිණිල්ලේ සඳහන් වන නමුත් අදාළ සිද්ධිය පිළිබඳ ඇසින් දුටු කිසිදු සාක්ෂියක් ඉදිරිපත් වී නොමැති බැවින් පැමිණිලිකාරිය පොලීසිය වෙත ඉදිරිපත් කර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැති බව නිරීක්ෂණය වේ.

මෙම සිද්ධියට පෙර කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පති (වැ.බ) වන බී.එම්.ඒ.ඒ.බණ්ඩාර යන අය විසින් පැමිණිලිකාරියට රාජකාරි කටයුතුවලදී පෞද්ගලික පළිගැනීම් සිදු කරන බවට පැමිණිලිකාරිය විසින් 2019.06.26 හා 2019.07.01 දිනවල මහනුවර කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ වෙත ලිඛිතව දැනුම් දී ඇතත්, ඒ සඳහා කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන ඇති බව තහවුරු නොවේ.

2019.07.31 දිනැතිව අතිරේක ලේකම්ගේ අත්සනින් යුතුව පැමිණිලිකාරිය හට අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබා දුන් ස්ථාන මාරුව සේවා අවශ්‍යතා මත ලෙස සඳහන්ව ලබා දී ඇතත්, අවශ්‍ය ප්‍රමාණයට නිලධාරීන් සිටින අධ්‍යාපන අමාත්‍යාංශයට මෙම පැමිණිලිකාරියගේ සේවය ලබා ගැනීමට තරම් ඇති වූ සේවා අවශ්‍යතාවය කුමක්ද යන්න ගැටලුකාරී වේ.

එහෙත් කොමිෂන් සභාව වෙත යොමු ගත ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්ගේ 2019.09.26 දින ලිපියේ සඳහන් වන්නේ පැමිණිලිකාරියගේ අසතුටුදායක සේවා තත්වය පිළිබඳ කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයාගේ පැමිණිල්ලකට අනුව පැමිණිලිකාරිය අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ස්ථාන මාරු කළ බවත්, පැමිණිලිකාරිය විසින් විදුහල්පතිවරයාට එරෙහිව කරුණු ඉදිරිපත් කර ඇති බැවින් ඒ පිළිබඳව සොයා බැලීමට පත් කළ කමිටුවේ අතුරු වාර්තාව අනුව මූලික විමර්ශනය අවසන් වන තෙක් පැමිණිලිකාරිය මහනුවර කලාප අධ්‍යාපන කාර්යයාලය වෙත අනුයුක්ත කර ඇති බවත්ය.

පැමිණිලිකාරියගේ සේවා තත්වය අසතුටුදායක බවට කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයාගෙන් ලැබුණු පැමිණිල්ල සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් පවත්වා සුදුසු ක්‍රියාමාර්ගයක් ගන්නා තෙක් පැමිණිලිකාරිය මුලින්ම මහනුවර කලාප අධ්‍යාපන කාර්යයාලයට අනුයුක්ත කිරීමට වගඋත්තර පාර්ශවයට හැකියාව තිබියදී පැමිණිලිකාරිය පදිංචි ස්ථානයේ සිට කි.මී.100 ක් පමණ දුරින් පිහිටා ඇති අධ්‍යාපන අමාත්‍යාංශයට ස්ථාන මාරු කිරීම, ද්වේශ සහගත ලෙස කටයුතු කිරීමක් බව නිරීක්ෂණය වේ.

පැමිණිලිකාරියගේ සේවා තත්වය අසතුටුදායක බවට කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා ඇත්තේ, 2019.07.31 දින වේ. මේ අනුව මසකට අධික කාලයක් තිබී ඇති බැවින් පැමිණිලිකාරියට එල්ල කර ඇති චෝදනා සම්බන්ධයෙන් මූලික විමර්ශනයක් සිදු කිරීමේ හැකියාව තිබියදී එසේ සිදු නොකර විදුහල්පතිවරයාගේ ඉල්ලීම අනුව ස්ථාන මාරුව සිදු කර ඇති බව මෙහිදී පැහැදිලි වේ.

පැමිණිලිකාරියට ස්ථාන මාරුව ලැබීමෙන් මාසයකට පමණ පසු මූලික විමර්ශනය සිදු කර ඇති අතර, එහිදී පැමිණිලිකාරිය මහනුවර කලාප අධ්‍යාපන කාර්යයාලයට අනුයුක්ත කිරීමට නිර්දේශ කර ඇති නමුත් ඇය විසින් විදුහල්පතිවරයාට එරෙහිව සිදු කර ඇති පැමිණිල්ල සම්බන්ධයෙන් කිසිදු නිර්දේශයක් නිකුත් නොකිරීම මඟින් අදාළ පරීක්ෂණ කමිටුව විදුහල්පතිවරයා ආරක්ෂා කිරීම මඟින් නීතියේ සමාන රැකවරණය පැමිණිලිකාරියට ලැබී නොමැති බව නිරීක්ෂණය වේ.

**නිගමනය :-**

පැමිණිලිකාරියගේ අසතුටුදායක සේවා තත්වය සම්බන්ධයෙන් කිංස්වුඩ් විද්‍යාලයේ විදුහල්පතිවරයා විසින් වගඋත්තර පාර්ශවය වෙත සිදු කළ පැමිණිල්ල සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් නොපවත්වා විදුහල්පතිවරයාගේ ඉල්ලීම අනුව සේවා අවශ්‍යතාවය ලෙස දක්වා පැමිණිලිකාරිය පදිංචි ස්ථානයේ සිට කි.මී.100 ක පමණ දුරින් පිහිටි අධ්‍යාපන අමාත්‍යාංශ වෙත සිදු කරන ලද ස්ථාන මාරුව මඟින් පැමිණිලිකාරියට 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සර්ව සාධාරණත්වයේ මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මෙයින් නිගමනය කරනු ලැබේ.

**නිර්දේශය:-**

I. ඒ අනුව, 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදයේ 12 (1) ව්‍යවස්ථාවෙන් සහතික කර ඇති සර්ව සාධාරණත්වයේ මූලික අයිතිවාසිකම් වගඋත්තර පාර්ශවය විසින් උල්ලංඝනය කර ඇති බැවින්, පැමිණිලිකාරියගේ ස්ථාන මාරුව අවලංගු කොට කිංස්වුඩ් විද්‍යාලයට ස්ථාන මාරුව ලබා දීමට වගඋත්තරකරුවන් විසින් පියවර ගත යුතු බවට නිර්දේශ කරනු ලැබේ.

II. අයුක්ති සහගත ලෙස ස්ථාන මාරුව සිදු කිරීමට කටයුතු කිරීම සම්බන්ධව විදුහල්පතිවරයාට සහ අධ්‍යාපන අමාත්‍යාංශයේ අතිරේක ලේකම්(පාලන) ට එරෙහිව විනය පියවර ගැනීමට ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත මෙහි පිටපතක් යොමු කරනු ලැබේ.

2022. 11. 24 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 (7) වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම්දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

රෝහිණී මාරසිංහ,
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික),
සභාපතිනී,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

විනිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

මා.හේ නිමල් කරුණාසිරි,
කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

Dr. M.H. Nimal Karunasiri
Commissioner
Human Rights Commission of Sri Lanka

පිටපත :-

01. ලේකම්,
රාජ්‍ය සේවා කොමිෂන් සභාව, — ඉහත II නිර්දේශය අනුව පියවර ගැනීමට

02. අමාත්‍යතුමා,
අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

02. මා.හි.කො.ස ප්‍රාදේශීය කාර්යාලය,
මහනුවර.

B/